# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2020 ජූලි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## මුදල් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2020 ජූලි මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය (Headline Inflation) 6.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය ජුනි මාසයේ මතුපිට උද්ධමනය 6.3%ක් ලෙස වාර්තා විය. 2020 ජූලි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 5.6%ක හා ආහාර නොවන කාණ්ඩයේ 0.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2019 ජූලි මාසයේ 2.2% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -1.1%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.4%ක් විය. 2019 ජූලි මාසයට සාපේක්ෂව 2020 ජූලි මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල්, සහල්, පොල්තෙල්, කහ කුඩු, අළුත් මාළු සහ සීනි යන ආහාර ද්‍රව්‍යවල පැවති ඉහළ මිල මට්ටම් ය.

2020 ජූලි මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකය 137.3ක් විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2020 ජූලි මාසයේ දර්ශකාංකයේ හෝ ප්‍රතිශතකාංකයේ කිසිදු වෙනසක් වාර්තා නොවීය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.15% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.15%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට එළවළු, රතුළූණු, දෙහි, සහල්, සුදු ළූණු, ලොකු ළූණු, වියළි මිරිස්, කරවල, පොල්, සීනි, දෙල්, මයිසූර් පරිප්පු, මිරිස් කුඩු, ගම්මිරිස්, තුනපහ කුඩු සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් අර්තාපල්, පළතුරු, කහ කුඩු, අමු මිරිස්, බිස්කට්, බිත්තර, අළුත් මාළු, කුකුළ් මස්, හාල්පිටි, පපඩම් සහ නූඩ්ල්ස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2020 ජූලි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ (පුවක්), ‘රෙදිපිළි හා පාවහන්', 'සෞඛ්‍ය' (පෞද්ගලික රෝහල් කාමර ගාස්තු), සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම බලපා ඇත. කෙසේ වෙතත් ‘විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩයේ මිල අඩුවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'ප්‍රවාහන' කාණ්ඩයේ සුළු වැඩිවීමක් වාර්තා වී ඇති අතර, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' කාණ්ඩයේ සුළු අඩුවීමක් වාර්තා වී ඇත. එහෙත්, පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ ‘අධ්‍යාපන' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2020 ජුනි මාසයේ 4.4% සිට 2020 ජූලි මාසයේ 4.5% දක්වා වැඩිවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2019** | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 |
| | අගෝ. | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 |
| | සැප්. | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 |
| | ඔක්. | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |
| | දෙසැ. | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 |
| **2020** | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |
| | පෙබ. | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව